## පොහොර යෙදීම

- හොඳින් දිරාපත් වූ කාබනික පොහොර වරින් වර ගස වටේට යොදා පසට මුල්ලු කරන්න.
- රසායනික පොහොර නිර්දේශිත පරිදි භාවිතා කරන්න. රසායනික පොහොර යෙදිය යුත්තේ පසෙහි තෙතමනය පවතින අවස්ථාවේදී ය.
- ගසෙහි අතු විහිදී ඇති ප්‍රදේශය තුළ පොහොර විසුරුවා හැර, පසට මුල්ලු කරන්න.




## ගස් පුහුණු කිරීම

- පළතුරු පැල සිටුවීමෙන් පසුව පොළවේ සිට අඩි 03ක් පමණ උසක් දක්වා ප්‍රධාන කඳෙන් හටගන්නා පාර්ශ්වික අතු ඉවත් කරන්න.



- ඉන්පසු විවිධ දිසාවන් හට ප්‍රධාන අතු 03 ක් වැඩීමට ඉඩ සලස්වන්න.
- ශාකය තුළට හොඳින් හිරුඑළිය පතිත වන සේ අනවශ්‍ය අතු දිය රිකිලි, රෝගී අතු ආදිය වරින් වර ඉවත් කරන්න.



- අතු ඉවත් කරන ලද ස්ථාන වල ආරක්ෂිත ආලේපයක් ගල්වන්න.
මෙමගින් තුවාලය ඉක්මණින් සුව වේ.

තාක්ෂණික උපදෙස්:

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

සැකසුම:

ඒකාබද්ධ ගොවිපල හා තිරසාර කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය, වර්ල්ඩ් විෂන් ආයතනය, 1119/2/1, මරදාන පාර, කොළඹ 08.

දුරකථනය:

011-2691233 / 2691234

**සරුසාර** ගෙවත්තකින්
**තිරසාර** ආදායමක්

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture

# බහු වාර්ෂික බෝග සංස්ථාපනය




ඒකාබද්ධ ගොවිපල හා තිරසාර කෘෂිකාර්මික
සංවර්ධන ව්‍යාපෘතිය

# බහු වාර්ෂික බෝග සංස්ථාපනය

අපට හුරු පුරුදු බොහෝ පලතුරු වර්ග සහ දැව වශයෙන් වගාකරනු ලබන ශාක මේ ගණයට ලා සැලකේ. ස්ථිර බෝග (වගාවන්) ලෙස ද මෙම වර්ග හඳුන්වනු ලැබේ.

වසර කිහිපයක් තිස්සේ අස්වනු ලබාගත හැකි පළතුරු වර්ග සහ නිසි වටිනාකමක් ලැබෙන තෙක් නඩත්තු කළ යුතු දැව ශාක ආදිය මෙයට උදහරණ වේ.

## පැළ තෝරා ගැනීම

- ප්‍රදේශයට සුදුසු බෝගයක් හා ප්‍රභේදයක් වීම.
- උසස් මව් ශාකයකින් ලබාගත් පැළයක් වීම.
- ශක්තිමත් හා නිරෝගී පැළ වීම.
- බද්ධ සන්ධිය හොඳින් ශක්තිමත්ව තිබීම.
- විශ්වාසදායී ස්ථානයක නිපදවා තිබීම.



## වලවල් සැකසීම

- සකසාගත යුතු වලෙහි ප්‍රමාණය පසෙහි ස්වභාවය අනුව තීරණය වේ. සාමාන්‍යයෙන් පලතුරු පැලයක් සඳහා සෙ.මී. 60 × 60 × 60 ප්‍රමාණයේ වලක් කපාගන්න.
- වල කැපීමේ දී ඉවත් වන මතුපිට පස් හා යට පස් වෙන් වෙන් වශයෙන් ගොඩ ගසන්න.
- වල පතුලට පොල් ලෙලි තට්ටුවක් දමන්න.
- හොඳින් දිරාපත් වූ ගොම පොහොර, කොළ පොහොර සමග මතුපිට පස් කළවම් කර වල පුරවාගන්න.




- පැළ සිටුවීමට දින දෙකකට පමණ පෙර එන්.පී.කේ. අඩංගු රසායනික පොහොර ස්වල්පයක් වලට දමා හොඳින් පස් සමග කළවම් කරන්න.

## පැල සිටුවීම

- වර්ෂා කාලය ආරම්භයත් සමග පැළ සිටුවන්න. දවසේ සවස් කාලය පැළ සිටුවීමට වඩා සුදුසුය.
- පැළය සිටුවා ඇති පොලිතින් බඳුන ප්‍රවේශමෙන් කපා ඉවත් කරන්න. බඳුන පතුලෙහි නැවී ඇති මුල් ආදිය ද කපා ඉවත් කරන්න.
- සකසාගත් වලෙහි මැදින් පස් ඉවත් කර එහි පැළය සිටුවන්න. පොලිතින් බඳුනෙහි පස් මට්ටම දක්වා පමණක් පැළය පසින් යට කරන්න.



## සෙවන සැපයීම

- පැළය සිටුවා එය තහවුරු වන තෙක් සෙවන සපයන්න.
- පැළය වර්ධනය වීමට පටන් ගත් පසුව සෙවන ඉවත් කරන්න.
- පැළය මුලට නොව පැළය වටේට වතුර දමන්න.



## ආධාරක සිටුවීම

- ඍජුව වර්ධනය වීමට ඉඩ සැලසෙන පරිදි සහ සුළඟට සෙලවී මූල මණ්ඩලයට හානි වීම වලකා ගැනීම සඳහා පැළය අසලින් ශක්තිමත් ආධාරකයක් සිටුවන්න.
- ස්ථාන දෙකකින් පමණ පැළය ආධාරකයට තබා ලණුවකින් බඳින්න.



## පරතරය

පැළයට හොඳින් වර්ධනය වීම සඳහා අවශ්‍ය ඉඩකඩ සලසාදීම මෙමගින් අදහස් වේ. ගෙවත්තක මෙවැනි පැළ කිහිපයක් සිටුවන විට අවට ඇති වෙනත් ශාක වලින් මෙම පැළය වැඩීමට බාධාවක් නොවීමට වගබලා ගන්න. ක්‍රමවත් වගාවක් වශයෙන් පැළ සිටුවන විට පැල හා පේලි අතර නිර්දේශිත පරතරයක් පවත්වා ගැනීමට කටයුතු කරන්න.

බහුලව වගාකරනු ලබන පළතුරු බෝග සඳහා නිර්දේශිත පරතර පහත දක්වා තිබේ.

| | | |
|---|---|---|
| පොල් | - | මීටර් 8 × 8 |
| කෙසෙල් | - | මීටර් 3 × 3 හෝ මීටර් 3.5 × 3.5 |
| කජු | - | මීටර් 6 × 6 |
| දොඩම් | - | මීටර් 4 × 4 |
| අඹ | - | මීටර් 10 × 10 |
| පේර | - | මීටර් 4.5 × 4.5 |
| ගස්ලබු | - | මීටර් 2 × 2 |
| දෙළුම් | - | මීටර් 3 × 3 |
| දිවුල් | - | මීටර් 10 × 10 |